# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/25 - 2019 සැප්තැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2019.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(XIV)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4)(ආ) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැළසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එය සාමාන්‍ය තත්ත්වයට නැවත පත් කිරීමට එම ආයතනයේ බලධාරීන් අපොහොසත් වී ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ශ්‍රී ලංකාවේ එකී විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත පිළිවෙලින් පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ එකී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට නිසි බලධරයා වශයෙන් බී. අසෝක කීර්ති ද සිල්වා 2019 සැප්තැම්බර් මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත් කරමි.

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

10 - 319

1A - PG 4654— 518 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*